www.agaram.lk

8526

OL/2016/87-S-I, II (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** ඔබ නව කතා පොතක් කියවමින් සිටී. එහි සන්නිවේදන මූලිකාංගවල අනුපිළිවෙළ කුමක් ද?
(1) සන්නිවේදකයා → පොත් ප්‍රකාශකයා → ග්‍රාහකයා
(2) සන්නිවේදකයා → පණිවිඩය → ග්‍රාහකයා
(3) පොත් ප්‍රකාශකයා → පණිවිඩය → ග්‍රාහකයා
(4) සන්නිවේදකයා → නාලිකාව → පණිවිඩය

**2.** දුම්රියක් පැමිණෙන තුරු දුම්රිය ස්ථානයක රැඳී සිටින මඟීන් පිරිසක් අතර ඇති වන සන්නිවේදනය,
(1) අන්තර් පුද්ගල සන්නිවේදනයකි.
(2) විධිමත් සන්නිවේදනයකි.
(3) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයකි.
(4) අවිධිමත් සන්නිවේදනයකි.

**3.** ප්‍රතිපෝෂණ කාර්යයෙහිලා වාචික සහ නිර්වාචික සන්නිවේදනය එකවර ඵලදායී ලෙස යොදා ගත හැකි වන්නේ,
(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ දී ය.
(2) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ය.
(3) කණ්ඩායම් සන්නිවේදනයේ දී ය.
(4) ජනසන්නිවේදනයේ දී ය.

**4.** ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාව වන්නේ,
(1) රුහුණු සේවයයි.
(2) මහනුවර සේවයයි.
(3) රජරට සේවයයි.
(4) වයඹ සේවයයි.

**5.** රේඛා ගුවන්විදුලි නිවේදිකාවකි. ඇයගේ වෘත්තියට වඩාත් ම අදාළ සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) විධිමත් සන්නිවේදනයයි.
(2) ජනසන්නිවේදනයයි.
(3) ශ්‍රව්‍ය සන්නිවේදනයයි.
(4) වාචික සන්නිවේදනයයි.

**6.** ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පළමු රූපවාහිනී මාලා නාටකය වන්නේ,
(1) දිමුතු මුතු ය.
(2) පළිඟු මැණිකේ ය.
(3) රටගිය ඇත්තෝ ය.
(4) කඩුල්ල ය.

**7.** ශ්‍රී ලංකාවේ මාධ්‍ය හිමිකාරිත්වයෙහි ප්‍රධාන වර්ග දෙක මොනවා ද?
(1) රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය
(2) රාජ්‍ය හා අර්ධ-රාජ්‍ය මාධ්‍ය
(3) සමාගම් හා තනි පුද්ගල මාධ්‍ය
(4) පවුල් හා රාජ්‍ය මාධ්‍ය

**8.** රූපවාහිනී ළමා මාලා නාටකයක් නරඹමින් සිටි සීතාට එහි රඟපාන කුඩා පිරිමි ළමයාගේ මුහුණ තම සහෝදරයාගේ මුහුණුවරට සමාන බව හැඟුණි. එසේ වීමට බලපා ඇති සන්නිවේදන වර්ගය,
(1) ජනසන්නිවේදනයයි.
(2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි.
(3) දෘශ්‍ය සන්නිවේදනයයි.
(4) පුද්ගලාන්තර සන්නිවේදනයයි.

**9.** පුවත්පතක පිටපත් සංස්කරණයේ වැඩි වගකීමක් පැවරෙන්නේ,
(1) ප්‍රධාන සංස්කාරකට ය.
(2) ප්‍රවෘත්ති සංස්කාරකට ය.
(3) උපසංස්කාරකට ය.
(4) සෝදුපත් බලන්නාට ය.

**10.** වැදගත් ම කරුණු මුලින් ම ඉදිරිපත් කරමින් සිදු කරන්නේ,
(1) දෘඪ පුවත් වාර්තාකරණයයි.
(2) මෘදු පුවත් වාර්තාකරණයයි.
(3) ගවේෂණාත්මක වාර්තාකරණයයි.
(4) නිර්මාණාත්මක වාර්තාකරණයයි.

[දෙවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**11.** එකම රූපවාහිනී වැඩසටහනක් තුළ ප්‍රවෘත්ති, කාලීන, භාව සංවේදී, විචිත්‍ර ආදී ගුණ රැසකින් යුත් කොටස් ගණනාවක් අන්තර්ගත කර ඇති විට එවැන්නක්,
(1) වාර්තා වැඩසටහනකි. (2) සෝප් ඔපෙරාවකි.
(3) යථාකාරී වැඩසටහනකි. (4) සඟරාමය වැඩසටහනකි.

**12.** හඬ, වචන සහ නිශ්ශබ්දතාව භාවිත කරමින් සමීපයේ නොමැති දෙයක් මවා පෙන්වීම ගුවන් විදුලි මාධ්‍යයේ දී සිදු කළ හැකි ය. මෙය
(1) චිත්ත රූප දැකීමයි. (2) පරිකල්පන ශක්තියයි.
(3) රූප සංජානනයයි. (4) භාව සංවේදී බවයි.

**13.** පුවත්පතක් සැලසුම් කිරීමේ දී මුලින් ම ඉඩ වෙන් කරනු ලබන්නේ,
(1) ප්‍රවෘත්ති වෙනුවෙනි. (2) රජයේ තොරතුරු වෙනුවෙනි.
(3) ශීර්ෂ පාඨවලට ය. (4) වෙළඳ දැන්වීම් සඳහා ය.

**14.** නව මාධ්‍ය කාණ්ඩය තෝරන්න.
(1) රූපවාහිනිය, කෙටි පණිවිඩ, සමාජ ජාල (2) විද්‍යුත් තැපැල, සමාජ ජාල, කෙටි පණිවිඩ
(3) අන්තර්ජාල පුවත්පත්, රූපවාහිනිය, ගුවන්විදුලිය (4) රූපවාහිනිය, වෙබ් රේඩියෝ, විද්‍යුත් තැපැල

**15.** අන්තර් පුද්ගල සන්නිවේදනයේ විශේෂත්වය වන්නේ,
(1) ජනමාධ්‍ය භාවිතයට උපයෝගී වීමයි. (2) තමා තුළ ම පවත්නා සන්නිවේදනයක් වීමයි.
(3) කුඩා පිරිසක් සමඟ සම්බන්ධ වීමයි. (4) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය වේගවත් වීමයි.

**16.** සෝදුපත් කියවීමේ දී සිදුවන්නේ,
(1) භාෂාත්මක දෝෂ නිවැරදි කිරීම සඳහා කියවීමයි. (2) අත්පිටපත හා මුද්‍රිත පිටපත සසඳා කියවීමයි.
(3) නිවැරදි අක්ෂර සංයෝජනය සඳහා කියවීමයි. (4) මුද්‍රණ හා ව්‍යාකරණ දෝෂ සකස් කරමින් කියවීමයි.

**17.** ශ්‍රී ලංකාවේ පළ වන ප්‍රධාන දිනපතා ජාතික පුවත්පත් බොහොමයක් අයත් වන ප්‍රමාණ කාණ්ඩය වන්නේ,
(1) බ්‍රෝඩ් ෂීට් (Broadsheet) ය. (2) ටැබ්ලොයිඩ් (Tabloid) ය.
(3) ෆුල් ඩිමයි (Fulldemy) ය. (4) කොම්පැක්ට් (Compact) ය.

**18.** මෘදු පුවත්,
(1) වැඩි දෙනෙකුට බලපෑම් ඇති කරන අතර නිර්මාණශීලී භාෂාවක් යොදා ගනී.
(2) වැඩි දෙනෙකුගේ අවධානය දිනා ගන්නා අතර හැඟීම්වලට ආමන්ත්‍රණය කරයි.
(3) කාලීන තොරතුරු ඉදිරිපත් කරන අතර බොහෝ විට මුල් පිටුවේ පළ කෙරේ.
(4) ඇතුළු පිටුවල බොහෝ විට පළ වන අතර ජාතික වැදගත්කමකින් යුක්ත වේ.

**19.** අන්තර්ජාලය භාවිත කරමින් තිදෙනෙකු සම්බන්ධ වී සිදු කරන සම්මන්ත්‍රණ දුරකථන සංවාදයක්,
(1) ජනසන්නිවේදන අවස්ථාවකි. (2) සමූහ සන්නිවේදනයකි.
(3) අන්තර් පුද්ගල සන්නිවේදනයකි. (4) සමාජ ජාලයකි.

**20.** 'බලපෑම' යන්න ප්‍රවෘත්ති ගුණාංගයක් ලෙස ගැනේ. ඒ අනුව කිසියම් සිද්ධියක් ප්‍රවෘත්තියක් වීමට නම් එය සමාජයේ,
(1) බහුතරයට නිශ්චිත බලපෑමක් සිදු කළ යුතු ය. (2) වැඩි පිරිසකට යහපත් බලපෑමක් සිදු කළ යුතු ය.
(3) සෑම දෙනාට ම නිශ්චිත බලපෑමක් සිදු කළ යුතු ය. (4) වැඩි පිරිසකට වැඩි බලපෑමක් සිදු කළ යුතු ය.

**21.** 'පුවත්පතක්' යනු සාමූහික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වුවත්, එහි වගකීම දරනු ලබන්නේ,
(1) කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ය. (2) ප්‍රධාන සංස්කාරක ය.
(3) ප්‍රධාන විධායක නිලධාරියා ය. (4) සභාපතිවරයා ය.

**22.** විද්‍යුත් මාධ්‍ය වෙත ග්‍රාහක ප්‍රතිචාර කඩිනමින් ලබා දීමට හැකි ක්‍රමවේද වන්නේ,
(1) ලිපි හා විද්‍යුත් තැපැලයි. (2) තැපැල් හා කෙටි පණිවිඩයි.
(3) ලිපි හා සමාජ ජාලයි. (4) කෙටි පණිවිඩ හා සමාජ ජාලයි.

**23.** ජනමාධ්‍ය ආයතනයක අභ්‍යන්තර මාධ්‍යවේදීන්,
(1) මාණ්ඩලික මාධ්‍යවේදීන් වේ. (2) නිදහස් මාධ්‍යවේදීන් වේ.
(3) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වේ. (4) පුරවැසි මාධ්‍යවේදීන් වේ.

**24.** මහජන සේවා මාධ්‍යවල අරමුණ විය යුත්තේ,
(1) අධ්‍යාපනික හා සංවර්ධනාත්මක තොරතුරු ලබා දීමයි.
(2) වැඩි ග්‍රාහක පිරිසක් නිරන්තරයෙන් රඳවා ගැනීමයි.
(3) තරඟකාරී ලෙස පොදු ජනතාවට තොරතුරු ලබා දීමයි.
(4) අනුග්‍රාහකත්වය මත වැඩසටහන් විසුරුවා හැරීමයි.

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**25.** ‘වායු සමනය කරන ලද කාර්යාලයෙන් ඉවතට පැමිණි වහාම උපැස් යුවළෙහි බැඳුණු ජලවාෂ්ප නිසා මාහට බස්රථයේ නාම පුවරුව කියවා ගත නොහැකි විය.’ මෙහි ඇත්තේ සන්නිවේදනය පිළිබඳ,

(1) අර්ථ බාධකයකි. (2) මාධ්‍ය බාධකයකි. (3) තාක්ෂණික බාධකයකි. (4) දෘශ්‍ය බාධකයකි.

**26.** කල්‍යාණි ලියූ නවකතාව මුද්‍රණය කර බෙදා හැරීමට ප්‍රකාශන සමාගමක් බාර ගනී. මෙහි මුද්‍රිත පිටපත් ප්‍රමාණය මත ඇයට ලැබෙන මූල්‍යමය ප්‍රතිලාභය,

(1) බුද්ධිමය දේපළයි. (2) ආර්ථික අයිතිවාසිකමයි.
(3) කර්තෘ භාගයයි. (4) ප්‍රකාශන හිමිකමයි.

**27.** ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන සංදේශවල අන්තර්ගතය පිළිබඳව අවම වශයෙන් බලපාන සාධකය වන්නේ,

(1) මාධ්‍ය ආයතන හිමිකාරිත්වයයි. (2) පවතින සමාජ සංස්කෘතික පසුබිමයි.
(3) පවතින දේශපාලන වාතාවරණයයි. (4) මාධ්‍ය තාක්ෂණයේ පොහොසත් බවයි.


**28.** සේයා පටල යොදා ගන්නා කැමරා භාවිත කිරීමේ දී ‘පටල වේගය’ වැදගත් වේ. මින් අදහස් වන්නේ,

(1) ආලෝක සංවේදිතාව පිළිබඳවයි. (2) ඉක්මනින් පින්තූර ගැනීමේ හැකියාවයි.
(3) වේගයෙන් මානනය කළ හැකි බවයි. (4) කඩිනමින් පටලය මාරු කළ හැකි බවයි.

**29.** ඔබගේ පාසලේ ක්‍රීඩා උත්සවය ලබන සතියේ පැවැත්වේ. ඒ පිළිබඳ පුවත්පතකට වාර්තා කිරීම ඔබට පවරා තිබේ. මෙවැනි අවස්ථාවක දී තොරතුරු රැස් කිරීමට සුදුසු ම ශිල්ප ක්‍රමය වන්නේ,

(1) සම්මුඛ සාකච්ඡාවයි. (2) නිරීක්ෂණයයි.
(3) ලේඛන පරිශීලනයයි. (4) බුද්ධි කලම්බනයයි.

**30.**




ඉහත රූපසටහනෙන් දක්වා ඇත්තේ එක් අයෙක් තෝරාගත් පිළිවෙළකට අනුව බොහෝ දෙනකු වෙත තොරතුරු ලබා දෙන අවිධිමත් සන්නිවේදන අවස්ථාවකි. මෙයින් දැක්වෙන්නේ,

(1) සම්භාවිතා දාමයකි. (2) ඔපාදූප දාමයකි. (3) තනි දාමයකි. (4) පර්ෂද දාමයකි.

**31.** මිතුරෙකු සමඟ කතා කරමින් පාර මාරු වීමට කහ ඉර අසල සිටින ඔබට නලාව ශබ්ද කරමින් වේගයෙන් එන මෝටර් රථයක් පෙනේ. මීළඟට කළ යුතු කාර්ය සඳහා ඔබට උදවු වන සන්නිවේදන වර්ගය වන්නේ,

(1) දෘශ්‍ය සන්නිවේදනයයි. (2) ශබ්ද සන්නිවේදනයයි.
(3) අන්තර් පුද්ගල සන්නිවේදනයයි. (4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි.

**32.** විදෙස් විශ්වවිද්‍යාලයකින් ශිෂ්‍යත්වයක් පිළිබඳ තොරතුරු විමසූ රොහාන්ට සිය අධ්‍යාපන සහතිකවල පිටපත් ඉක්මනින් එවන ලෙස දුරකථන පණිවිඩයක් ලැබේ. මෙහි දී ඔහුට වඩාත් උපකාරී වන්නේ,

(1) ටෙලි මේල් සේවාවයි. (2) ඊමේල් පහසුකමයි. (3) ෆැක්ස් සේවාවයි. (4) පේජරයයි.

**33.** ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වයට අදාළ **නො වන්නේ** මින් කවරක් ද?

(1) ගුවන් විදුලි නාලිකා සඳහා බලපත්‍ර නිකුත් කිරීම (2) රූපවාහිනී නාලිකා සඳහා කොන්දේසි පැනවීම
(3) විද්‍යුත් මාධ්‍ය සඳහා ආචාරධර්ම සැකසීම (4) නාලිකාවලට අවවාද කිරීම හා බලපත්‍ර තහනම් කිරීම

**34.** මාධ්‍ය විචාරකයා යනු,

(1) මාධ්‍ය-ග්‍රාහක සම්බන්ධතාව ශක්තිමත් කරන්නා ය.
(2) ජනමාධ්‍ය ආයතනවල සේවය කරන වෘත්තිකයෙකි.
(3) මාධ්‍ය සංදේශවලට ප්‍රතිචාර දක්වන සක්‍රිය ග්‍රාහකයෙකි.
(4) මාධ්‍ය ආයතන සඳහා සේවා සපයන අනුග්‍රාහකයෙකි.

**35.** වෙබ් රේඩියෝවක් සම්බන්ධයෙන් **නො ගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) FM රේඩියෝ නාලිකාවකට සාපේක්ෂව වියදම අඩු වේ.
(2) ලොවපුරා ඕනෑම තැනක සිට ශ්‍රවණය කළ හැකි ය.
(3) මුදල් ගෙවා බලපත්‍රයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.
(4) සරල උපකරණ කිහිපයකින් පවත්වාගෙන යා හැකි ය.

[හතරවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**36.** සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රීය ග්‍රන්ථයක් සම්පාදනය කරන රාජා ඊට ජාත්‍යන්තර අගයක් එක් කරනු වස් ISBN අංකයක් ලබා ගැනීමට අපේක්ෂා කරයි. මේ සඳහා ඔහු යා යුත්තේ,

(1) මහජන පුස්තකාලයට ය. (2) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට ය.
(3) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ය. (4) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට ය.

**37.** ජනමාධ්‍යයක වාර්තාකරණයේ විශ්වසනීයත්වය රඳා පවතින්නේ ප්‍රධාන වශයෙන්,

(1) නිරවද්‍යතාව, සමතුලිතබව හා ආකර්ෂණීයබව මත ය.
(2) සමතුලිතබව, ආකර්ෂණීයබව හා සරලබව මත ය.
(3) පැහැදිලිබව, නිරවද්‍යබව හා සංක්ෂිප්තබව මත ය.
(4) නිරවද්‍යබව, සමතුලිතබව හා පැහැදිලිබව මත ය.

**38.** විමල් ජනමාධ්‍ය සමග නිරන්තර සම්බන්ධතා පවත්වන්නෙකි. ජනමාධ්‍ය වැඩසටහන්වලට අනුව සිය දෛනික වැඩකටයුතු සැලසුම් කරන ඔහු දුරකථනයෙන් මාධ්‍ය ආයතන වෙත ඇමතුම් ලබා දී ඒවායේ වැඩසටහන් අන්තර්ගතය අගය කිරීමට පුරුදුව සිටී. ඒ අනුව විමල්,

(1) විචාරශීලි ග්‍රාහකයෙකි. (2) නිශ්ක්‍රීය ග්‍රාහකයෙකි.
(3) සක්‍රීය ග්‍රාහකයෙකි. (4) අක්‍රීය ග්‍රාහකයෙකි.

**39.** රූපවාහිනී ළමා වැඩසටහන් අතරතුර ඉදිරිපත් කෙරෙන සමහර වෙළඳ දැන්වීම් ඔවුන්ගේ පාරිභෝගික වටිනාකම ප්‍රදර්ශනය කරයි. ඊට වඩාත් ගැළපෙන නිදසුනක් සපයන වෙළඳ දැන්වීම් කාණ්ඩය වන්නේ,

(1) ඇඳුම් පැළඳුම්, රූපලාවන්‍ය හා ආහාරපාන වේ. (2) ළදරු නිෂ්පාදන, පෝෂණය හා ළමා සෞඛ්‍ය වේ.
(3) කිරිපිටි, ළමා රක්ෂණය හා අධ්‍යාපනය වේ. (4) කෘත්‍රිම ආහාරපාන, ක්‍රීඩා උපකරණ හා රසකැවිලි වේ.

**40.** පන්ති කාමරයක පැවැති සාකච්ඡාවක තේමාව වූයේ 'සමාජ මාධ්‍ය ජාලවල ප්‍රවණතා' යන්නයි.

කවිතා : එය මාධ්‍ය නිදහසේ නව පියවරක්, ඒ වගේ ම අදහස් හුවමාරුවට තියෙන ඉඩ පුළුල් වෙනවා.

රාණි : ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යවලට සාපේක්ෂව වැඩිදුර අවධානයට ලක් නො වන ප්‍රවෘත්ති සඳහා වැඩි ඉඩක් වෙන් කෙරෙනවා.

දේවි : අන්වර්ථ නම්වලින් පෙනී සිට ඕනෑම කෙනෙකු අපකීර්තියට ලක් කරන්නත් ඉඩ තියෙනවා.

නිරූපා : මුද්‍රිත මාධ්‍යයට සාපේක්ෂව සමාජ මාධ්‍ය ජාලවල තොරතුරු යාවත්කාලීන කිරීම සීමා සහිතයි.

ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි අදහස් ඉදිරිපත් කරන්නේ,

(1) කවිතා, රාණි හා නිරූපා ය. (2) කවිතා, රාණි හා දේවි ය.
(3) රාණි, දේවි හා නිරූපා ය. (4) කවිතා, දේවි හා නිරූපා ය.

* *

[පස්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවන** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

---

1. රුවන්, මහේෂ් සහ කමලා එකතු ව සකස් කළ පිටු විස්සකින් යුත් මාධ්‍ය ව්‍යාපෘති වාර්තාව මුද්‍රණය කර ගැනීම සඳහා ඔවුහු නගරයේ පිහිටි නවීන පහසුකම් සහිත සන්නිවේදන මධ්‍යස්ථානයක් වෙත යාමට එකඟ වූහ.

(i) ඉහත එකඟතාවයට පදනම් වූ සන්නිවේදන වර්ගය කුමක් ද?

(ii) ව්‍යාපෘති වාර්තාවට අදාළ දත්ත එක්රැස් කිරීමේ දී යොදා ගැනීමට ඉඩ ඇතැයි විශ්වාස කළ හැකි ක්‍රම **දෙකක්** දක්වන්න.

(iii) පරිගණක මුද්‍රණයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(iv) පරිගණක අකුරු ඇමුණුම සිදු කළ වහා ම විදෙස් රටක සිටින තම සොයුරාට එහි මෘදු පිටපතක් යැවීමට මහේෂ් පොරොන්දු වී තිබුණි. ඊට වඩාත් ම සුදුසු විධි ක්‍රමය කුමක් ද?

(v) මුද්‍රණය කරන ලද වාර්තාවේ දෘඪ පිටපතක් තම පෞද්ගලික පරිහරණය සඳහා තබා ගැනීමට රුවන් බලාපොරොත්තු වේ. මේ සඳහා වඩාත් ම සුදුසු ක්‍රමය කුමක් ද?

(vi) මුද්‍රිත වාර්තාවේ මුල් පිටුවෙහි ආරක්ෂාව සඳහා ප්ලාස්ටික් ආවරණයක් යෙදීම සුදුසු බව කමලා ප්‍රකාශ කළා ය. මෙම විධි ක්‍රමය කෙසේ හඳුන්වන්නේ ද?

(vii) ඉහත කී වාර්තාව පොතක් ලෙස බැඳීමේ දී යොදා ගත හැකි බැඳුම් ක්‍රම **දෙකක්** දක්වන්න.

(viii) යුනෙස්කෝ අර්ථකථනයට අනුව පොතක තිබිය යුතු අවම පිටු ප්‍රමාණය කොපමණ ද?

(ix) පොත් සහ සඟරා හැරුණු විට දක්නට ලැබෙන මුද්‍රිත මාධ්‍ය ස්වරූප **දෙකක්** නම් කරන්න.

(x) මුද්‍රිත මාධ්‍ය බොහොමයක ඡායාරූප භාවිතය නිතර දක්නට ලැබේ. ඡායාරූප හැරුණු විට ඒවායේ භාවිත කෙරෙන රූපාශ්‍රිත ප්‍රකාශන විධි **දෙකක්** සඳහන් කරන්න.

2. (i) "ලංකාවේ ප්‍රකාශයට පත් පළමු පුවත්පත ලක්මිණි පහනයි" ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතුව දක්වන්න.

(ii) "බුද්ධිමය දේපළ පනත තුළ 'කෘතිය' යනුවෙන් හඳුන්වන්නේ පොත්, ලිපි හා පත්‍රිකා ය." ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතුව දක්වන්න.

(iii) " 'අර්ථ බාධක' යනු සංදේශය නිසි ලෙස ග්‍රාහකයා වෙත සම්ප්‍රේෂණය නොවීම නිසා ඇති වන තත්ත්වයකි." ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු **තුනක්** දක්වන්න.

(iv) "මුද්‍රිත මාධ්‍යයට ඡායාරූප එක්වීම වාසිදායක වූවකි." ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු **හතරක්** දක්වන්න.

3. (i) ශ්‍රී ලංකාවේ දැනට බහුල ලෙස භාවිත වන ගුවන් විදුලි තරංග වර්ගය කුමක් ද?

(ii) පුවත්පත්-සඟරා, රූපවාහිනී-සිනමා යන ජනමාධ්‍යවල ග්‍රාහකයා හඳුන්වන විශේෂිත නාම **දෙක** පිළිවෙළින් දක්වන්න.

(iii) රූපවාහිනී මාධ්‍ය වැඩසටහන් ප්‍රභේද **තුනක්** කෙටියෙන් හඳුන්වන්න.

(iv) මාධ්‍ය වාර්තාකරණයේ දී භාවිත කළ හැකි මූලාශ්‍රය **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



Agaram.lk - Keep your dreams alive !

**4.** ලංකා ජාතික පාසලේ සියවන සංවත්සරය අධ්‍යාපන ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

(i) පාසලේ ඉතිහාසය දැක්වෙන චිත්‍රපටයක් නිර්මාණය කර තිබේ. එවැනි චිත්‍රපට හඳුන්වන නාමය කුමක් ද?

(ii) උත්සවයේ දී එය ප්‍රදර්ශනය කිරීමට භාවිත කළ යුතු මාධ්‍ය උපකරණ **දෙකක්** නම් කරන්න.

(iii) විදුහලට නව විද්‍යුත් තැපැල් ලිපිනයක් නිර්මාණය කෙරිණි. විද්‍යුත් තැපෑලෙහි ඇති ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) උත්සවය පිළිබඳ ප්‍රධාන කරුණු **හතරක්** ඇතුළත් ප්‍රවෘත්තියක මුලපාඨය රචනා කර, අදාළ කරුණු යටින් පැහැදිලිව ඉරි ඇඳ පෙන්වන්න.

**5.** (i) ශ්‍රී ලංකාව තුළ පුවත්පත් පිළිබඳ පිළිගත් ආචාරධර්ම පද්ධති කිහිපයක් ම ක්‍රියාත්මක වේ. ඒවා අතුරින් එක් ආචාරධර්ම පද්ධතියක් නම් කරන්න.

(ii) මුද්‍රිත මාධ්‍ය ක්ෂේත්‍රයේ අත් පත්‍රිකා යනු විශේෂිත සන්නිවේදන ක්‍රමයකි. අත් පත්‍රිකා භාවිතය වඩාත් උචිත වන අවස්ථා **දෙකක්** දක්වන්න.

(iii) පුවත්පත් සඳහා ප්‍රවෘත්ති වාර්තා කිරීමේ දී 'යටිකුරු පිරමිඩ' ක්‍රමය බොහෝවිට භාවිත කෙරේ. එකී වාර්තාකරණයේ වාසි **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ගුවන්විදුලිය ප්‍රබල ජනමාධ්‍යයකි. එහෙත් ඊට ආවේණික දුබලතා බොහෝ ය. එවැනි දුබලතා **හතරක්** විස්තර කරන්න.

**6.** අන්තර් පාඨශාලීය ක්‍රීඩා තරගයෙන් ජයගත් රවීගේ ක්‍රීඩකත්වය පිළිබඳ බොහෝ දෙනා ප්‍රසාදයෙන් කථා කරනු ඇසිණි.

(i) ක්‍රීඩකයෙකු හාත්පස සිටින ශ්‍රාවකයන් දෙස නිරතුරුව බලමින් කථාව පවත්වාගෙන යයි. මෙම උපක්‍රමය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

(ii) තරගයේදී රවීට උදව් වී යැයි සිතිය හැකි නිර්වාචික ලක්ෂණ **හතරක්** නම් කරන්න.

(iii) රවීගේ ජයග්‍රහණය පිළිබඳ පුවත්පත්වල තොරතුරු පළවී තිබුණි. ඒ සඳහා යොදා ගෙන තිබූ පුවත්පත් අන්තර්ගතයට අයත් අංග **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ක්‍රීඩා තරගයකට සූදානම් වීමේ දී රවී වැඩි වශයෙන් තොරතුරු ලබා ගන්නේ නව මාධ්‍ය ඇසුරිනි. නව මාධ්‍යයේ ස්වභාවය කරුණු **හතරක්** ඇසුරින් පැහැදිලි කරන්න.

**7.** සන්නිවේදකයා → පණිවිඩය → මාධ්‍ය → ග්‍රාහකයා → X

(i) ඉහත රූප සටහන හැරල්ඩ් ලැස්වෙල්ගේ සන්නිවේදන නිර්වචනය ඇසුරින් සකසා ඇත්නම්, එහි අවසාන අංගය වන X නම් කරන්න.

(ii) X නැමැති අංගය සමඟ සන්නිවේදන අරමුණු සමීප සබඳතාවක් දක්වයි. ප්‍රධාන සන්නිවේදන අරමුණු **හතර** කවරේ ද?

(iii) පාසල් පංති කාමරය තුළ දී සිදුවන්නේ ද සන්නිවේදන ක්‍රියාවලියකි. එහි දී උපයෝගී කර ගත හැකි ප්‍රක්ෂේපණීය නො වන පන්ති කාමර මාධ්‍ය උපකරණ **තුනක්** භාවිත කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ඉහත රූප සටහනට අදාළ සන්නිවේදන ක්‍රියාවලිය ජනමාධ්‍ය තුළ දී ද සිදු වේ. ජනමාධ්‍ය සතු විශේෂ ලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

* * *

agaram.lk